# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2353/26 – 2023 ඔක්තෝබර් මස 10 වැනි අඟහරුවාදා – 2023.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/J/2015/31.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2017.11.15 දිනැති හා අංක 2045/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අඟුළුගහ, දොරපෙ, මහගොඩවත්ත හි පදිංචි එම්. සුනිල් මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 42/2017 හා 2023.07.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 040484 – 18 (2023/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

*නඩු අංකය :* ඒ./42.2017

IR/COM/01/J/2015/31.

එම්. සුනිල්,
මහගොඩ වත්ත,
දොරපෙ,
අගුළුගහ.

පැමිණිලිකරු - *පළමු පාර්ශ්වය.*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකාර *පාර්ශ්වය.*

ප්‍රදානය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම බේරුම්කරු වශයෙන් 2017.11.10 වැනි දින මා පත්කොට මා වෙත පවරා ඇත.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :**

''ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු වූ එම්. සුනිල් මහතා වෛද්‍ය නිර්දේශ මත විශ්‍රාම ගැන්වීමේ දී ඔහුට වන්දි මුදල් නොගෙවීම හා වෛද්‍ය නිර්දේශ මත ඔහු ලබාගත් නිවාඩු සඳහා අඩ වැටුප් නොගෙවීම යුක්තිසහගත ද? එසේ නොවේ නම් එම්. සුනිල් මහතාට හිමිවිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

කාර්මික ආරාවුල් පනත යටතේ සම්පාදිත 21(1) නියෝග ප්‍රකාරව දෙපාර්ශ්වයේ සවිස්තරාත්මක ප්‍රකාශ දැක්වීමෙන් අනතුරුව පිළිතුරු හුවමාරු කරවා ගැනීමට අවස්ථාව සලසා දී සමථයක් සඳහා ඉඩ ලබාදුන් පසුව සමථයක් නොමැති බවට වාර්තා කිරීමෙන් අනතුරුව විමසුමට ගන්නා ලදී.

මේ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු සාක්ෂි ලබා දෙමින් A1 සිට A18 දක්වා ලේඛන ලකුණු කරමින් ද වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු (සේවක සම්බන්ධතා) දයාන් සේනක තුඩුගල මහතා සාක්ෂි ලබාදෙමින් R1 සිට R10 දක්වා ලේඛන ලකුණු කරමින් ද තම තමන්ගේ නඩු අවසන් කර ඇති අතර දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ගොනු කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදින් දෙපාර්ශ්වය තම තමන්ගේ ලකුණු කරන ලද ලේඛන සමඟ ලිඛිත දේශන ගොනු කොට ඇත.

කාර්මික අධිකරණය හා බේරුම්කරු අධිකරණ බලය ලබා ගන්නේ විෂය භාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙනි. එම යොමු කිරීම සමඟ සිද්ධියට අදාළ කම්කරු කොමසාරිස්තුමා විසින් සකස් කරනු ලැබූ ප්‍රකාශයක් ද එවනු ලැබ ඇත.

ඒ අනුව යොමු වෙත අවධානය යොමු කිරීමේ දී එහි ප්‍රධාන කොටස් දෙකක් හඳුනාගත හැකියි.

- ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු වූ එම්. සුනිල් මහතා වෛද්‍ය නිර්දේශ මත විශ්‍රාම ගැන්වීමේ දී ඔහුට වන්දි මුදල් නොගෙවීම හා වෛද්‍ය නිර්දේශ මත ඔහු ලබාගත් නිවාඩු සඳහා අඩ වැටුප් නොගෙවීම යුක්තිසහගත ද?

- එසේ නොවේ නම් එම්. සුනිල් මහතාට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න වේ.

මෙම යොමු කිරීම් දෙක අතර සම්බන්ධයක් පවතින්නේ වී නමුත් ඒවා වෙන වෙනම සලකා බැලීම වටී.

**මුලින්ම පළමුවන යොමු කිරීම සලකා බැලීමේ දී,**

මේ අනුව මෙහිදී විශේෂයෙන්ම (ප්‍රධාන වශයෙන්) තීරණය කළයුතු වන්නේ ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට වෛද්‍ය හේතුන් මත විශ්‍රාම යෑමට සිදුවීමෙන් වන්දියක් හිමිවිය යුතු ද යන්න සහ,

ඊට අමතරව අඩ පඩි ගෙවිය යුතු ද යන්න යන කොටස් දෙක වේ. එය ද වෙන වෙනම සලකා බැලිය හැක.

එසේම, මෙහිදී දෙපාර්ශ්වය විසින් එකඟ වන කාරණාවන් ගණනාවක්ම හඳුනාගත හැක.

- ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමට තීරණය කළ බව.
- විශ්‍රාම ගැන්වීම පිළිබඳ ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය විරෝධතාවයක් නොදැක්වූ බව.
- වර්ෂ 2013.07.08 දින සිට විශ්‍රාම ගිය බව.
- දින 25 කට අදාළ අඩ පඩි ගෙවූ බව.
- තවත් දින 66කට අඩ පඩි නොගෙවූ බව.

සියල්ලටම ප්‍රථමයෙන් තීරණය කළයුතු වන්නේ ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය 2013.07.08 දින වෛද්‍ය හේතුන් මත විශ්‍රාම යන විට වලංගුව පැවතියේ කුමන නීතිය ද / චක්‍රලේඛන දැයි යන වැදගත්ම ප්‍රශ්නයයි. සමස්ථයක් ලෙස සලකා බැලීමේ දී වගඋත්තරකාර දෙවන පාර්ශ්වය චක්‍රලේඛයන් ගණනාවක් අදාළ කාලපරාසය තුළ නිකුත් කර ඇති බැවින් සහ චක්‍රලිපි යැයි හඳුන්වා දෙනු ලබන යම් යම් ලිපි නිකුත් කර ඇති බැවින් යම් ව්‍යාකූල තත්ත්වයක් නිර්මාණය කර ඇත. සේවායෝජක දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි සඳහා කැඳවූ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු කාර්මික සම්බන්ධතා, දයාන් සේනක තුඩුගල මහතා ද සාක්ෂි ලබාදෙමින් යම් යම් ගැටලු තිබූ බව පවසයි. වර්ෂ 2023.05.19 සාක්ෂි සටහන් පිටුව 15.

ප්‍ර : 2013 අංක 03 චක්‍රලේඛය ක්‍රියාත්මක කළා ද ඒ ආකාරයෙන් ?

පි : ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඇති වෙලා තිබෙනවා. ඒ නිසා එම චක්‍රලේඛය අහෝසි කළා.

ප්‍ර : ගැටලු මොනවාද කියලා කළමනාකරණ මහතෙක් හැටියට ?

පි : විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධයෙන්.

කාලයෙන් කාලයට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය ද විටින් විට විවිධ චක්‍රලේඛයන් නිකුත් කරමින් වඩාත් සංකීර්ණ තත්ත්වයක් නිර්මාණය කර ඇත. උදාහරණයක් වශයෙන් 15(1) චක්‍රලේඛනයේ ඒ වන විට විශ්‍රාම ගන්වා සිටින සේවකයන්ට / නඩු පවරා ඇති සේවකයන්ට එම නඩු ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව නැවත හිඟ වැටුප් රහිත සේවා බණ්ඩනයකින් තොරව නැවත සේවයට එක්විය හැක. මේ බව ඉහත නම් සඳහන් සේවායෝජක දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු ද පිළිගෙන ඇත. (වර්ෂ 2023.05.19 සාක්ෂි සටහන් පිටුව 03.)

සේවායෝජක දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරුට (2023.05.19 සාක්ෂි සටහන් පිටුව 14) කියන ආකාරයට සේවකයන් 30,000ක් සිටින ආයතනයකට තමන්ගේ සේවකයන්ගේ විශ්‍රාම ගන්වන වයස සම්බන්ධයෙන් නිවැරදි චක්‍රලේඛයක් නිකුත් කළ නොහැක්කේ මන්දැයි ප්‍රශ්නයක් මතු වෙයි. කලින් කලට විවිධ චක්‍රලේඛන නිකුත් කරමින් සමහර ඒවා සංශෝධනය කරමින් හා සමහර ඒවායේ සමහර කොටස් පමණක් අවලංගු කරමින් ආදී වශයෙන් මෙම තත්ත්වය සංකීර්ණ කර ඇත.

ඒ අනුව ඉතා පරිස්සමින් මෙම ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට අදාළව ක්‍රියාත්මක විය යුත්තේ කුමන චක්‍රලේඛනය දැයි සොයාගත යුතුය.

ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය තමන්ට අදාළ වන්නේ A10 ලෙස ලකුණු කරනු ලැබූ 1974 අංක 04 චක්‍රලේඛනය යැයි පවසයි. එසේම ඔවුන් ඊට පසුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 01/2013 චක්‍රලේඛනය එනම් A14 ලෙස ලකුණු කළ චක්‍රලේඛනය ද අදාළ බව පවසයි.

එසේ වුව ද සේවායෝජක දෙවන පාර්ශ්වය පවසන්නේ 1976/ අංක 05 දරන චක්‍රලේඛනය අදාළ වන බවයි.

කරුණු ඉතා පරිස්සමෙන් විග්‍රහ කර බැලීමේ දී 2015/01 දරන චක්‍රලේඛය ද (A15) 2013/ අංක 03 දරන චක්‍රලේඛය ද (A16) ලකුණු කළ ද ඒවා සියල්ලම ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය විශ්‍රාම ගිය දිනට පසුව නිකුත් කළ සහ ක්‍රියාත්මක වන බැවින් ඔහුට අදාළ නොවේ.

උදා : 2013/03 චක්‍රලේඛනය නිකුත් කරනුයේ 2013.10.14 එය ක්‍රියාත්මක වනුයේ 2013.09.01 සිටය. (A16) 2015/01 චක්‍රලේඛනය නිකුත් කරනුයේ 2015.03.18 (A17)

දෙපාර්ශ්වය විසින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අදාළව ලකුණු කරනු ලැබූ හරස් ප්‍රශ්න අසනු ලැබූ චක්‍රලේඛන අතරින් 2013.07.08 ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය විශ්‍රාම යන විට වලංගුව පැවති බවට හඳුනාගත හැකි වන්නේත් 2011.12.12 දින නිකුත් කරනු ලැබූ ''A17'' ලෙසට ලකුණු කර ඉදිරිපත් කරනු ලැබ ඇති 15/2011 චක්‍රලේඛයයි. මෙම චක්‍රලේඛනය නිකුත් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංගම සේවකයන්ගේ විශ්‍රාම යෑමේ වයස ගැන පමණයි. ඒ අනුව දෙවන ඡේදය මගින් 1975.04.04 දිනට ප්‍රථම සේවයට බැඳී ඇති සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60ක් ලෙස එලෙසම පවතී යනුවෙන් සඳහන්ව ඇති අතර 03 වන ඡේදය මගින්,

- වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 55 ක් ද,
- ස්ව කැමැත්ත මත සේවා දිගු ඉල්ලීමකින් තොරව සේවය කළ හැකි වයස අවුරුදු 57ක් ද විය යුතුය. (A17C) යනුවෙන් දක්වා ඇත.

එසේම ඉහත සඳහන් 15/2011 චක්‍රලේඛනය සලකා බැලීමේ දී ''ශ්‍රී ලංගම සේවක මණ්ඩල කොට්ඨාස චක්‍රලේඛ 1972 අංක 38, 1976 අංක 05 හා 2011 අංක 02 කෙරෙහි අවධානය යොමු කරවමි.'' යනුවෙන් මුල්ම ඡේදයේ සඳහන්ව ඇත.

ඒ අනුව පෙනී යන්නේ මෙම චක්‍රලේඛය එහි සඳහන් කරන ලද චක්‍රලේඛයන්ට ද අදාළව නිකුත් කරන බවයි. ඒ අනුව මෙම A17 චක්‍රලේඛය නිකුත් කළ පසු වලංගු 15/2011 චක්‍රලේඛනය බවට තීරණය කරමි.

වර්ෂ 2013.10.13 දින නිකුත් කරනු ලැබූ A16 නිකුත් වන තාක් වලංගුව පැවතියේ මෙම චක්‍රලේඛයයි. එය වගඋත්තරකාර දෙවන පාර්ශ්වය ද හබ නොකරයි.

ඊට පසුව ලකුණු කරන ලද ලේඛන අතරින් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය විශ්‍රාම ගැන්වූ දිනය වන 2013.07.08ට ආසන්න දිනයක නිකුත් කර තිබෙන්නේ A14 ලෙසට ලකුණු කර ඉදිරිපත් කර ඇති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 1/2013 චක්‍රලේඛයයි.

එම චක්‍රලේඛනය අනුව විශ්‍රාම ගැන්වීමේ වයස 60 බවට තහවුරු කර ඇත. එසේ වුව ද එය ප්‍රකාශිතව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය පිළිගනිමින් ක්‍රියාත්මක කරනු ලබන්නේ 2013/03 චක්‍රලේඛනයෙනි. එය නිකුත් කරනු ලබන්නේ 2013.10.14 දිනැතිව එනම්, ඉල්ලුම්කාර සේවක මහතා විශ්‍රාම ගත් පසුවයි.

සේවායෝජක දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු විසින් හරස් ප්‍රශ්න අසනු ලැබූ අවස්ථාවේ දී මෙකී 2013/3 (A16) චක්‍රලේඛනයේ පැවති ප්‍රශ්න නිසා A151 ලකුණු කළ වර්ෂ 2015/1 පරිදි නිකුත් කරන ලද බව ප්‍රකාශ කර ඇත.

ප්‍ර : ඒ 14 චක්‍රලේඛය මහත්තයා දැකලා තිබෙනවා ද ?

පි : ඔව්.

2023.05.19 සාක්ෂි සටහන් පිටුව 13.

ප්‍ර : මොකක් ද ?

පි : මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයක්.

ප්‍ර : ඒක මොකක් කියලා ද කියන්නේ ?

පි : රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01.

ප්‍ර : 2013 අංක 03 චක්‍රලේඛය ක්‍රියාත්මක කළා ද ඒ ආකාරයෙන් ?

(2023.05.19 සාක්ෂි සටහන් පිටුව 14)

පි : ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඇතිවෙලා තිබෙනවා ඒ නිසා එම චක්‍රලේඛය අහෝසි කළා.

ප්‍ර : ගැටලු මොනවා ද කියලා කළමනාකරණ මහතෙකු හැටියට ?

පි : විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධයෙන්.

(2023.05.19 සාක්ෂි සටහන් පිටුව 15)

සේවායෝජක දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට අදාළ වන්නේ R2 ලෙස ලකුණු කරනු ලැබූ 1976 අංක 05 දරන චක්‍රලේඛනය ලෙසට ස්ථාවරයක් ගන්නා වී නමුත් එම චක්‍රලේඛයට පසුව චක්‍රලේඛන ගණනාවක් මණ්ඩලීය සේවකයන් විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇත. උදා: (A17), වර්ෂ 2011 අංක 03, (A14), වර්ෂ 2013 මුදල් හා ක්‍රමසම්පාදන.

මේවා විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධයෙන් පමණි. එසේම මෙහි දී විශේෂ තත්ත්වයක් එනම්, වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම වැනි විශේෂ අවස්ථාවක් සම්බන්ධයෙන් දක්වා නැත. ඒ අනුව එවැනි සඳහනක් කිරීමක් හමු වන්නේ A10 ලෙස ලකුණු ඉදිරිපත් කර ඇති 1974/04 චක්‍රලේඛනයේ ය.

ඒ අනුව මෙම චක්‍රලේඛනය තවදුරටත් මෙකී සුවිශේෂී කාරණා සම්බන්ධයෙන් වලංගුව පවතී.

තව ද සේවායෝජක දෙවන පාර්ශ්වය විසින් මෙම ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට අදාළ වන බවට R9 ලේඛනය ලකුණුකොට චක්‍ර ලිපියක් බවට හඳුන්වා දෙමින් ඉදිරිපත් කර සිටී. එය බැලූ බැල්මටම කේ. එම්. අත්තනායක නමැති පුද්ගලයෙකුට අදාළව බදුල්ල සී/ස ඌව බස් සමාගමේ අ.ශි.ප.ප. නමින් නිකුත් කරනු ලැබූ පෞද්ගලික ලිපියකි. එය පොදුවේ 5 ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සියලුම සේවකයන්ට ආදේශ කරන්නට උත්සාහ කිරීම පිළිගත නොහැක. චක්‍රලේඛනයක් මගින් ප්‍රසිද්ධකොට සියලුම ආයතන ප්‍රධානීන්ට දන්වා සිටිනු ලැබූ විධිමත් ලේඛනයන්ගේ සඳහන් ප්‍රතිපාදනයන් පාර්ශ්වයන් දෙකක් අතර හුවමාරුවන ලිපියකින් වෙනස් කිරීමට තැත් කිරීමත් එය අනෙකුත් සේවකයන්ට අදාළ කිරීමට උත්සාහ කිරීමත් නීත්‍යානුකූල නැත. තව ද එය අදාළ වන්නේ වයස අවුරුදු 55න් විශ්‍රාම ගන්නා සේවකයන්ට පමණි.

ඒ අනුව ඉහත විස්තර කර ඇති ලෙසට ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය 2013.07.08 දින විශ්‍රාම යන විට වලංගුව පැවතියේ 2011/15 දරන ශ්‍රී ලංකා මානව සම්පත් චක්‍රලේඛයයි (A17). එහි විශ්‍රාම යැමේ / ගැන්වීමේ වයස අවුරුදු 57කි. එය වයස අවුරුදු 55 නොවන බවට තීරණය කරමි. ඒ අනුව වයස අවුරුදු 57 දක්වා සේවය කළ හැකි සේවකයෙකු වෛද්‍ය හේතූන් මත විශ්‍රාම යැමේ දී 1974/04 චක්‍රලේඛනය අනුව වන්දි මුදලක් හිමිවිය යුතුය. එය නොගෙවීම සාධාරණ සහ යුක්ති සහගත නොවේ.

යොමුවේ පළමු කොටසේ දෙවනුව සඳහන් අඩ වැටුප් සම්බන්ධයෙන් සලකා බැලූ කළ ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට දින 25කට අඩ වැටුප් ගෙවා තිබුණත් තවදුරටත් ඉතිරි දින සඳහා අඩ වැටුප් ගෙවීමට පවතින බවත් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය පිළිගනී. (99-25-66) එය ගෙවීමට නොහැකි වී ඇත්තේ ඒ සම්බන්ධයෙන් වූ වෛද්‍ය සහතිකවල මුල් ලේඛන නොමැති වීම නිසා බව වගඋත්තරකාර දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර ඇත. හරස් ප්‍රශ්න මගින් ද පිළිගෙන ඇත.

නමුත් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය මුල් ලේඛන ලබා දුන් බව ප්‍රකාශ කරයි. එසේම A6 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර ඇති අඩපඩි සහිත විශේෂ නිවාඩු ඉල්ලුම්පත්‍රයේ ඉදිරිපත් කරන වෛද්‍ය සහතික ගණනාවක් සඳහන් කොට ඇත. එය භාරගෙන නිසි පරිදි පවතින බවට සෑහීමකට පත්ව ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයේ ඉතිරි නිවාඩු සම්බන්ධ විස්තරත් සහිතව නිවාඩු ලිපිකරු විසින් පුරවා අත්සන් කර ආයතන අංශ ප්‍රධානියා විසින් අත්සන් කර ඩිපෝ කළමනාකරණ මගින් ප්‍රධාන කාර්යාලයට එවා ඇත. නිසි පරිදි ලේඛන නොතිබුණේ නම් මෙම ඉල්ලුම්පත්‍රය භාර ගැනීමට නොහැක. වෛද්‍ය සහතිකයන්ගේ මුල් ලේඛන කොටසකුත් ඉතිරි ඒවායේ ඡායාස්ථ පිටපතුත් තිබුණේ වී නම් එය භාර නොගත යුතුය. මන්ද අසම්පූර්ණ අයදුම්පතකි. එසේ නොමැතිව භාර ගත්තේ නිසි පරිදි අයදුම්පත තිබූ නිසාවෙන් තිබිය යුතුය.

අතරමග ඇල්පිටිය ඩිපෝවේ සිට ප්‍රධාන කාර්යාලය දක්වා යොමු කිරීමේ දී හෝ ප්‍රධාන කාර්යාලයේ දී වෛද්‍ය සහතිකයන්ගේ කොටසක් අස්ථානගත වූයේ නම් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට කළහැකි කිසිවක් නැත. ඔහුට නැවත වරක් ලබාදිය හැක්කේ ඡායාස්ථ පිටපතක් පමණි. එය ද ඔහු සන්තකයේ තබාගෙන තිබූ නිසාවෙනි. ඔහුගෙන් නැවත නැවත මුල් ලේඛන ඉල්ලා සිටීම නිෂ්ඵල ක්‍රියාවකි. ඔහු විසින් නොකළ ක්‍රියාවකට ඔහුට දඬුවම් කිරීම නිවැරදි නොවේ. යම් යම් නිලධාරීන්ගේ අතපසුවීම්, නොසලකා හැරීම් සම්බන්ධයෙන් ඒ අදාළ නිලධාරියා වගකීම භාර ගතයුතුය.

මේ සියලු වෛද්‍ය සහතික ශ්‍රී ලංගම ප්‍රවාහන වෛද්‍ය මධ්‍යස්ථානයෙන් නිකුත් කරන ලද ඒවාවන අතර ඒ කාලයේදීම උනන්දුවෙන් සොයා බැලුවේ නම් දෙවැනිවර ඉදිරිපත් කර තිබෙන වෛද්‍ය සහතිකවල ඡායාස්ථ පිටපත් සම්බන්ධයෙන් නිරවද්‍යතාවය පහසුවෙන් තහවුරු කරගත හැකිව තිබුණි. එසේ ද නොකොට දිගින් දිගටම ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයෙන් සමථයක් ලෙසට හෝ එකී ලේඛන ඉල්ලා සිටීම වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ අධිකාරී බලය පෙන්වීමකි. ඒ අනුව මෙකී ලේඛන අස්ථානගත වීමේ හෝ නොමැති වීමේ වගකීම වගඋත්තරකාර දෙවන පාර්ශ්වය ගත යුතුය. එසේ වගකීම වෙනතකට යොමු කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවේ. ඒ අනුව යොමුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු වූ එම්. සුනිල් මහතා වෛද්‍ය නිර්දේශ මත විශ්‍රාම ගැන්වීමේ දී වෛද්‍ය නිර්දේශ මත ඔහු ලබාගත් නිවාඩු සඳහා අඩ වැටුප් නොගෙවීම යුක්තිසහගත නොවන බවට තීරණය කරමි.

ඒ අනුව යොමුවේ දෙවන කොටසට වෙනම අවධානය යොමු කිරීමේ දී, ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට 1974/04 චක්‍රලේඛනය අනුව නියම කළ වන්දි මුදල හිමිවිය යුතු බවට නියෝග කරමි. ''A10F'' ලෙසට ලකුණුකොට ඉදිරිපත් කර ඇති A10 ලේඛනයෙහි සටහන අනුව හා ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය ලබාදුන් සාක්ෂිය අනුව රු. 317,460.00 (26,455.00×12) වන්දි මුදලක් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් ගෙවිය යුතු බවට තීරණය කරමි.

එසේම A15 ලෙස ලකුණුකොට ඉදිරිපත් කර ඇති ඇල්පිටිය ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරිතුමාගේ නියෝගය පරිදි අඩ වැටුප් සඳහා ගෙවිය යුතු හිඟ මුදලවන රු. 66,137.50 ක මුදල ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් ගෙවිය යුතු බවට තීරණය කරමි.

තව ද A15 ලෙසට ලකුණුකොට ඉදිරිපත් කර ඇති ලේඛන අනුව ඇල්පිටිය ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරි විසින් වගඋත්තරකාර දෙවන පාර්ශ්වයට ගෙවීමට නියම කර ඇති ප්‍රතිපූර්ණය කළයුතු වෛද්‍ය ගාස්තු වශයෙන් රු. 1,150/= ක මුදලක් ද ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට ගෙවීමට නියම කරමි.

ඒ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට ලබාගත හැකිවන පරිදි රු. 317,460.00 (රුපියල් තුන් ලක්ෂ දහහත් දහස් හාරසිය හැට)ක වන්දි මුදලක් ද, රු. 66,137.50 (රුපියල් හැට හයදහස් එකසිය තිස් හතයි සත පනහ) ක අඩ පඩි ද, රු. 1,150.00 (රුපියල් එක් දහස් එකසිය පනහ) ක ප්‍රතිපූර්ණය කළ යුතු වෛද්‍ය ගාස්තු ද වශයෙන් රු. 384,747.50 (රුපියල් තුන් ලක්ෂ අසූ හතර දහස් හත්සිය හතළිස් හතයි සත පනහ) ක මුදලක් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ඉල්ලුම්කරුට ලබාගත හැකි වන පරිදි සහකාර කම්කරු කොමසාරිස් වෙත *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුළත තැන්පත් කරන ලෙස නියෝග කරමි.

මෙකී ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලෙසට සහතික කරමි.

එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

2023 ජූලි මස 18 වැනි දින දීය.

EOG 10 - 0108

---

මගේ අංකය: IR/COM/03/2016/73.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.17 දිනැති හා අංක 2084/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.08.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හකුරුවෙල, කුඹුක්මුල්ල, තල්ගස්වත්ත, අංක 105/5 හි පදිංචි බී. එම්. ප්‍රදීප් මංජුල මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 59/2018 සහ 2023.07.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී

නඩු අංකය - A/59/2018.
IR/COM/03/2016/73.

බී. එම්. ප්‍රදීප් මංජුල මයා
අංක 105/5,
තල්ගස්වත්ත,
කුඹුක්මුල්ල,
හකුරුවෙල.

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සුනෙත් ලොකුබෝගහවත්ත වන මා 2018.08.08 වන දින පත්කර එය මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින මා වෙත යොමු කරන ලද ආරාවුල වනාහී,

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කරන බී. එම්. ප්‍රදීප් මංජුල මහතාට විරුද්ධව ප්‍රවේශ පත්‍ර විෂමාචාරයක් පදනම් කරගෙන 2014.09.29 වන දින පැවැත් වූ විනය පරීක්ෂණය හා ඊට අදාළව ලබා දුන් දඬුවම් යුක්ති සහගත ද? එසේ නොවේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද? යන්න පිළිබඳව වේ."

කාර්මික ආරාවුල් පනත යටතේ සම්පාදිත 21(1) නියෝගය ප්‍රකාරව දෙපාර්ශ්වයේ සවිස්තරාත්මක ප්‍රකාශය දැක්වීමෙන් අනතුරුව පිළිතුරු හුවමාරු කරවා ගැනීමට අවස්ථාව සලසා දී සමථයක් සඳහා ඉඩ ලබා දුන් පසුව සමථයක් නොමැති බවට වාර්තා කිරීමෙන් අනතුරුව විමසීමට ගන්නා ලදී. මේ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කාර සේවක මහතා සහ වගඋත්තරකාර දෙවන පාර්ශ්වය යටතේ සේවයේ නියුතු ඕමන්තගේ ගයාන් සාක්ෂි ලබා දී A 1 සිට A 12 දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කර ඇති අතර වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් මනම්පේරිගේ දොන් ජානක නිරෝෂන් සහ අනෝජ් දර්ශන ගුණසිංහ සාක්ෂි ලබා දෙමින් R 1 සිට R 21 දක්වා ලේඛන ලකුණු කරමින් වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ නඩුව අවසන් කොට ඇති අතර දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ගොනු කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදින් දෙපාර්ශ්වය විසින්ම ලිඛිත දේශන ගොනු කොට ඇත.

කාර්මික අධිකරණය හා බේරුම්කරු බලය අත්පත් කර ගත්තේ විෂය භාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙනි. එම යොමු කිරීම සමග සිද්ධියට අදාළව කම්කරු කොමසාරිස්තුමා විසින් සකස් කරනු ලැබූ ප්‍රකාශයක් ද එවනු ලැබ ඇත. ඒ අනුව යොමුව වෙත අවධානය යොමු කිරීමේ දී එහි ප්‍රධාන කොටස් දෙකක් හඳුනා ගත හැකිය.

01. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කරන බී. එම්. ප්‍රදීප් මංජුල මහතාට විරුද්ධව ප්‍රවේශ පත්‍ර විෂමාචාරයක් පදනම් කරගෙන 2014.09.29 වන දින පැවැත් වූ විනය පරීක්ෂණය හා ඊට අදාළව ලබා දුන් දඬුවම් යුක්ති සහගත ද?

02. එසේ නොවේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද?

වශයෙනි. මෙම කාරණා දෙක අතර සම්බන්ධයක් පවතින්නේ වී නමුත් වෙන වෙනම සළකා බැලුවෙමි.

**මුලින්ම, 01 වන යොමු කිරීම සළකා බැලීමේදී,**

මෙහිදී අනිවාර්යයෙන් ද සළකා බැලිය යුත්තේ ඉල්ලුම්කාර සේවක මහතාට එරෙහිව පැවති විනය පරීක්ෂණය ඊට අදාළව ලබා දුන් දඬුවමිය.

මෙහිදී දඬුවම ලබා දුන්නේ ජංගම පරීක්ෂණය මත පැවැත්වූ විනය පරීක්ෂණයේදී වන අතර දඬුවම ස්ථිර වූයේ විනය පරීක්ෂණ තීරණයට එරෙහිව පැවති අභියාචනා විභාගයට පසුව බැවින් යොමුවේදී විනය පරීක්ෂණය ලෙසට සටහන් වුවත් ඒ තුළ ජංගම පරීක්ෂණය, විනය පරීක්ෂණය මෙන්ම අභියාචනා විනය විභාගය ද සළකා බැලිය යුතුව ඇත.

මේ සියළු අවස්ථාවන්හිදී සාධාරණ හා යුක්ති සහගත පරීක්ෂණයක් සිදු වූයේද, සාධාරණ හා යුක්ති සහගත ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබුවේද යන්න තීරණය කරන්නට තිබෙන කාරණාව වේ.

ප්‍රශ්නගත කාරණාව හා සම්බන්ධ සිද්ධියේදී පාර්ශවයන් අතර යම් යම් කාරණා අතර හබයක් නැත. ඒවා නම්,

1. මගී කාන්තාව අම්බලන්තොටින් බස් රථයට ගොඩ වූ බවත් කරාපිටිය දක්වා ගමන් කිරීමට නියමිතව සිටි බව,
2. බස් රථයේ මගීන් පිරී සිටි බව (90 ක් හෝ 74 ක් හෝ වේ) හා එවැනි අවස්ථාවක එක් එක් මගියා සම්බන්ධයෙන් නිශ්චිතව තොරතුරු කීමට නුපුළුවන් බව.
3. මගී කාන්තාව ටිකට් පතේ වටිනාකම දැන සිටි බව.
4. කොන්දොස්තරවරයෙකු වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට අමතරව වෙනත් කාර්යයන් ගණනාවක් පවරා ඇති බව. (R16)
5. ජංගම පරීක්ෂණයකදී අනුගමනය කළ යුත්තේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ පාලන පිළිවෙත් 18 බව (එනමුත් පාලන පිළිවෙත් සම්බන්ධ ලේඛන සාක්ෂිකරුවන් මඟින් ඉදිරිපත් කර නැත.)
6. ශ්‍රී ලංගම විනය කාර්ය පටිපාටියට අයත් 1975 අංක 01 නිත්‍ය උපදෙස්වලට යටත්ව විනය පරීක්ෂණය පැවැත්විය යුතු බව.

මෙහිදී ඉහත විස්තර කර ඇති පරිදි ප්‍රධාන අවස්ථා 3 ක් හඳුනාගත හැක.

01. **ජංගම පරීක්ෂණයේදී**

මෙම ජංගම පරීක්ෂකවරුන් විසින් සිදුකරනු ලැබූ පරීක්ෂණය සිදුකරනු ලැබූ ආකාරය සමස්ථයක් ලෙස බැලූ කළ එය මුල පටන්ම කොන්දොස්තර තැන වරදක් සිදු කර ඇත යන ස්ථාවරයේ සිට මෙහෙයවා ඇති බවක් අනාවරණය වන්නේදැයි සැක සිතේ.

මන්ද මූලිකව සළකා බැලීමේදී ජංගම පරීක්ෂකයන් විසින් මගී කාන්තාව ලබා දුන් ප්‍රකාශය පූර්ණ වශයෙන් සත්‍ය වන බවට වන ස්ථාවරයක සිට කටයුතු කොට ඇත. ඇය විසින් කොන්දොස්තර තැනට මුදල් දුන්නද ටිකට් පතක් ලබා නොදුන්න බවට කරන ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු කොට නොමැත.

එය කළ හැකිව තිබුනේ,

1. ඒ පිළිබඳව තවත් ස්වාධීන සාක්ෂියක් සොයාගැනීම. (ඇසින් දුටු කෙනෙකුගේ/එම බස් නැවතුමෙන්ම බස් රථයට ගොඩ වූ තවත් පුද්ගලයින් සිටිය හැක.)
   යම් පුද්ගලයෙකු සොරෙන් ගමන් කිරීමට අපේක්ෂාකර ඒ අනුව කටයුතු කරන්නේ නම් කොන්දොස්තර මහතුන්ගෙන් ගැලවී සිටීමට උපක්‍රම යොදා ඒ අනුව කටයුතු කිරීමට හැකි බවට වූ කාරණාව සම්පූර්ණයෙන්ම බැහැර කර ඇත.

කොන්දොස්තර මහතෙකු මගීන්ගෙන් මුදල් අයකර චේතාන්විතව ටිකට් පත් නිකුත් නොකර ඒ මුදල් තම සන්තකයට ගැනීම සිදු කරන්නේ නම් තවත් මගීන්ට ද ඒ ආකාරයෙන් සිදු කළ හැකි බවට, වන කරුණට අවධානය යොමු නොකිරීම හා මෙම කාන්තාවම පමණක් එසේ සිදු කළ බවට තීරණය කර ඇත.

යමෙකුට මුදල් ලබා දුන් පසු ටිකට් පතක් නිකුත් නොකරන්නේ නම් මගියෙකුගේ යුතුකම හෝ වගකීම ටිකට් පතක් ඉල්ලා සිටීම වන අතර එසේ නොකළේ මන්දැයි ප්‍රශ්නයක් පැන නගී. මන්ද ජංගම පරීක්ෂකයන් බස් රථයට ගොඩවුන හොත් අදාළ මගියා වරදකරු වන බව සැවොම දන්නා කරුණකි.

තවද අදාළ මගී කාන්තාව කොන්දොස්තර තැනගෙන් මුදල් ගෙන ටිකට් පතක් නිකුත් නොකළේ නම් මගී කාන්තාව ඒ පිළිබඳව ද කොන්දොස්තර තැනගෙන් විමසා සිටියේ නම් එය බස් රථයේ සිටින අනෙක් මගීන්ට ද ඇසිය හැකි සැවොම උනන්දු වන ආකාරයේ දෙබසකි. එය කිසිදු මගියෙකුට නෑසුනේද? මෙය විය හැකිද යන්න ප්‍රශ්නයක් මතු කරයි.

කොන්දොස්තර තැන ටිකට් පත නිකුත් කර එය ජංගම පරීක්ෂකයන් ඉල්ලා සිටින විටදී ඉදිරිපත් කිරීමට අපහසු වීම/නැති වීම/දමූ තැන සොයා ගැනීමට නොහැකි වීම මත මගී කාන්තාව වෙනත් කතාවක් කීමට ඇති හැකියාව වැනි කිසිදු කාරණාවක් සම්බන්ධයෙන් අවධානය යොමු කර නැත.

තමන්ට ටිකට් පතක් නිකුත් නොකළ බව මගී කාන්තාව හොඳාකාරවම දන්නේ නම් බසයේ මධ්‍යයට වන්නට සිටි මගී කාන්තාව තමා වෙතට පැමිණි ජංගම පරීක්ෂකයන් ටිකට් පත් ඉල්ලන තෙක් නොසිට මේ සම්බන්ධයෙන් කලින් ඉදිරිපත් නොවූයේ මන්දැයි ප්‍රශ්නයක් ද ඇත.

2. ටිකට් පත් යන්ත්‍රය පරීක්ෂා නොකිරීම.
   ජංගම පරීක්ෂකයන් විනය පරීක්ෂණයේ දී ටිකට් පත් යන්ත්‍රය පරීක්ෂා කළ බවට සාක්ෂි ලබා දුන්නේ වී නමුත් එසේ පරීක්ෂා නොකළ බවට ඉල්ලුම්කරු සාක්ෂි ලබා දී ඇත. (2019.4.50 සාක්ෂි සටහන් පි. 4 හා 5) මේ සම්බන්ධයෙන් ඔවුන්ට ප්‍රකාශ කරනවා විනා පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර දෙවන පාර්ශවය සමත් වන්නේ නැත.

3. ටිකට් අනු පිටපත් සමඟ සසඳා බැලිය හැකි අවස්ථාවක් තිබුනේ වී නමුත් ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකිරීම. A9/R12 වැනි ලේඛනයන් ලබාගැනීමට හැකියාව තිබුනේ නම් ඒ පිළිබඳව අවධානය යොමු නොකළේ මන්ද යන ගැටලුව පැන නගී.

02. **විනය පරීක්ෂණය**

මෙහිදී ජංගම පරීක්ෂකයන් ඉදිරිපත් කරනු ලැබූ කරුණු පිළිගනු විනා කිසිදු කරුණක් සම්බන්ධයෙන් ස්වාධීනව විමසා බලා, එය විය හැකි/හෝ නොවිය හැකි බව සම්බන්ධයෙන් බර තැබීමක් සිදු කොට නැත.
උදා.- ටිකට් පතක් මුදල් ගෙවා නිකුත් නොකළා යැයි කියන ප්‍රකාශය

මෙම ප්‍රශ්නගත සිද්ධි සමුදාය ගැට ගැසී තිබෙන්නේ මගී කාන්තාවගේ ප්‍රකාශ මතය. ඇය ජංගම පරීක්ෂකයන්ට ම ඒ අවස්ථාවේදී ප්‍රකාශයක් ලබා දී ඇත. (R 7)

මේ ප්‍රකාශය විනය පරීක්ෂණයේ දී ලකුණු කර ඇත්තේ ජංගම පරීක්ෂකයින් මගිනි. මගී කාන්තාව සාක්ෂියට කැඳවා නැත. ඒ සම්බන්ධයෙන් මෙම බේරුම්කරණයේ දී වගඋත්තරකාර දෙවන පාර්ශවය සේවා යෝජක වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මනම්පේරිගේ දොන් ජානක නිරෝෂන් යන සාක්ෂිකරු ද මගී කාන්තාව විනය පරීක්ෂණය සඳහා කැඳවීමක් කර තිබෙන නමුත් ඇය සාක්ෂි ලබා දී නැති බවටත් ප්‍රකාශ කර ඇත. (2022.10.13 සාක්ෂි සටහන් පිටුව 3) නමුත් විනය පරීක්ෂණ, ගොනුව පරීක්ෂා කළ විට (R 13) මුල් පිටුවේ පැමිණීම සටහන් කරන ස්ථානයේ මෙසේ සටහන් කොට ඇත.

"නොපැමිණීම - මල්ලිකා ජයසිංහ මහත්මිය බාහිර සාක්ෂිකාරිනී දැනුම් දීමක් කර නැත."

මෙය බැලූ බැල්මට පෙනී යන්නේ ඇයව විනය පරීක්ෂණයට කැඳවා නැති බවයි. නමුත් ඉහත ලෙසට සාක්ෂිකරු ප්‍රකාශ කළ පරිදි නොපැමිණීම යටතේ සටහන් කර ඇති බැවින් ඇයට දැනුම් දී ඇය නොපැමිණ එසේ නොපැමිණෙන බව දැනුම් දී නැත යන්න ද විය හැක. ඒ කෙසේ වුවද ඇය සාක්ෂි දී නැත. ඉතා වැදගත් සාක්ෂියක් වූ ඇයගේ සාක්ෂිය ගැනීමට විනය පරීක්ෂණයේදී කටයුතු නොකිරීම බරපතල වැරැද්දකි. ඇය එදින නොපැමිණියේ නම් වෙනත් දිනයක කැඳවීමට තිබුණ ද එසේ කර නැත.

එසේම වගඋත්තරකාර දෙවන පාර්ශවයේ සාක්ෂිකරුවකු වූ මනම්පේරිගේ දොන් ජානක නිරෝෂන් යන සාක්ෂිකරු මගී කාන්තාවගේ ප්‍රකාශය (R 7) ලේඛනය තහවුරු කර නොමැති බවට ඔහුම පිළිගනී.

ප්‍ර: ඒ කියන්නේ විනය පරීක්ෂණයේ දී R 7 ලේඛනය තහවුරු කර සාක්ෂි ලබා දීලා නැහැ.

පි: ඔව්

(2022.10.13 සාක්ෂි සටහන් පිටුව 3)

ඒ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශවයට ද මගී කාන්තාවගෙන් හරස් ප්‍රශ්න ඇසීමට තිබූ අවස්ථාව මග හැරී ඇත.

ඒ අනුව ප්‍රශ්නගත R 7 ලේඛනය මත චෝදනා නගා ඇතත් එය සාක්ෂි මගින් ප්‍රමාණවත් පරිදි තහවුරු කර නැත. (රු. 90 ක් අයකර ටිකට් පතක් නිකුත් නොකිරීම)

විනය නියෝගයේ (R 19) 01 පිටුවේ 1 වන චෝදනාව යටතේ 2 වන ඡේදයේ මුදල් ලබා ගත්ත ද ප්‍රවේශ පත් දීමට අමතක වන්නට ඇතැයි පවසන ලදී, යනුවෙන් සඳහන් කර ඉල්ලුම්කාර පළමු පාර්ශවය වරදකරු කර ඇත. එය සාවද්‍ය කරුණු ගෙන හැර දැක්වීමකි. ඒ මහතා එසේ ප්‍රකාශ කර නැත. R 10 ලෙසත් A 1 ලෙසත් ලකුණු කර ඉදිරිපත් කර ඇති ජංගම පරීක්ෂකගේ වාර්තාවේ 4 වන පිටුවේ දැක්වෙන්නේ ''පසුව කොන්දොස්තර මහතා, ඇය ළඟට කැඳවා ප්‍රශ්න කිරීමේ දී කොන්දොස්තර මහතා කියා සිටියේ ටිකට් පත දුන්නාදැයි හරියට මතක නැති බවයි.

එසේම ඉල්ලුම්කාර පළමු පාර්ශවය මුල් අවස්ථාවේ තම ප්‍රකාශයට ලෙසට ඉතා කෙටි ප්‍රකාශයක් ලබා දෙමින් පසුව දීර්ඝ ප්‍රකාශයක් ලබා දෙන බවටත් පසුව දීර්ඝ ප්‍රකාශයක් ලබා දෙමින් ද මේ ආකාරයේ (R 19 ලේඛනයේ සඳහන්) ප්‍රකාශයක් කරන්නේ නැත.

ඉල්ලුම්කාර පළමු පාර්ශවයට විරුද්ධව ඉදිරිපත් කර ඇති දෙවන චෝදනාව වන්නේ රු. 37.50 ක වැඩිපුර මුදලක් ළඟ තබා ගැනීම වේ.

මේ පිළිබඳව ඉල්ලුම්කාර පළමු පාර්ශවයේ ස්ථාවරය වන්නේ මාරුකාසි නොමැතිවීම මත එසේ රු. 37.50 ක මුදලක් වැඩිපුර එකතු වී තිබූ බවයි. (2015.04.05 සාක්ෂි සටහන් පිටුව 33) ඒ සම්බන්ධයෙන් කිසිදු බර තැබීමක් සිදු කර නැත.

එසේම වගඋත්තරකාර දෙවන පාර්ශවය යටතේ සේවා නියුතු ඕමන්තගේ ගයාන් යන අය ද එය විය හැකි බව පිළිගෙන ඇත. (2022.04.27 සාක්ෂි සටහන් පිටුව 09)

තවද ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ (R 17) නොමැති විෂමාචාර චෝදනාවක් ගොනු කර ලැබ ඇති බව ඉල්ලුම්කාර පළමු පාර්ශවය ස්ථාවරයක් ගෙන ඇත.

එය වගඋත්තරකාර දෙවන පාර්ශවය යටතේ සේවයේ නියුතු විනය පරීක්ෂණ නිලධාරි ඕමන්තගේ ගයාන් මහතා සාක්ෂි මගින් ද පිළිගෙන ඇත.

ප්‍ර: මම අහන ප්‍රශ්නය මුදල් වැඩිපුර ළඟ තබා ගැනීම බරපතල විෂමාචාර ක්‍රියාවක් කියලා ඔය විනය ව්‍යවස්ථාවේ කොහෙවත් සඳහන් වෙනවාද කියලා?

පි: මේ 34 ට අදාළ නැහැ.

ප්‍ර: වෙනත් කොහෙවත් ඔය විනය ව්‍යවස්ථාවේ එහෙම දෙයක් සඳහන් වෙලා තියෙනවාද?

පි: විෂමාචාර සම්බන්ධයෙන් තිබෙන්නේ ඒ උපලේඛනය පමණයි.
(2022.04.27 දින විභාග සටහන් 09, 10 පිටු)

R 17 ලේඛනය පරීක්ෂා කිරීමේදී A උපලේඛනයේ ලෙසට බරපතල විෂමාචාරයන් සමහරක් ද B උපලේඛනය ලෙසට බරපතල නොවන විෂමාචාර ක්‍රියාවන් සමහරක් යනුවෙන් චෝදනාවන් 11 ක් ලැයිස්තු ගත කර ඇත. මෙම උපලේඛන දෙකේම සමහරක් යනුවෙන් සඳහන් කර තිබීම මත තවත් විෂමචාරයන් චෝදනාවන් (මෙහි සඳහන්ව නොමැති) තිබිය හැකි බවට අනුමානයක් ඇති කර ගත හැක. කෙසේ වුවද මෙකී චෝදනාව සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පැමිණිලි පාර්ශවයේ පැහැදිලි කිරීම පිළිගත හැකියාවක් යන්න සළකා බැලුවෙමි.

මෙම බස් රථය ගමන් ආරම්භ කරන්නේ උදෑසන 5.30 ට එනම් මුල්ම ගමන් වාරය සඳහායි. එම නිසා කලින් එකතු වූ මාරු කාසි තිබීමට තිබෙන හැකියාව අඩුය. තවද මගීන් ඒ දවසේ මුදල් භාවිතා කරන්නේ උදෑසන බස් රථයේදීම විය හැක. එම නිසා මගීන් සතුව ද මාරු කාසි නොතිබෙන්නට පුළුවන. එම නිසා දෙපාර්ශවයේම මාරු කාසි නොමැතිවීම මත කොන්දොස්තර මහතා ළඟ වැඩිපුර මුදල් එකතු වී තිබීමට හැකියාවක් ඇත.

ඒ අනුව ඉල්ලුම්කාර සේවක මහතා පළමු පාර්ශවයේ සාක්ෂිය සහ ජංගම පරීක්ෂකවරුන්ට දෙන ප්‍රකාශ අනුවත් වගඋත්තරකාර දෙවන පාර්ශවයේ විනය පරීක්ෂණ නිලධාරි ඕමන්තගේ ගයාන් මහතා ලබාදුන් සාක්ෂිය අනුවත් ඒ බව සිදු විය හැක.

එසේම ජංගම පරීක්ෂකවරු ගොඩවන්නේ ගමනාන්තයේදී නොව අතරමගදීය. එම නිසා මාරු කාසි නොමැතිවීම මත යම් යම් පුද්ගලයින්ට ඉතිරි මුදල් (විශේෂයෙන්ම කාසි) දීමට තිබුනා වන්නට ද බැරි නැත. (තවම ලබා නොදුන් නමුත් ඉදිරියේදී දීමට)

මේ සියලු කරුණු සළකා බැලූ කල එම චෝදනාවම වරදකරු කිරීමට ඉල්ලුම්කාර සේවක මහතා ගොනු කරනු ලබන ව්‍යවස්ථාපිත/නීතිමය බාධාවට අමතරව ප්‍රායෝගික වශයෙන් ද සාධාරණ සහ යුක්ති සහගත පදනමක් නැති බව පෙනී යයි.

තවද විනය පරීක්ෂණ වාර්තා මත හිඳිමින්ම පමණක් ජ්‍යෙෂ්ඨ විනය නිලධාරි විසින් දඬුවම් නියම කිරීම දැකිය හැකි අතර කිසිදු ආකාරයක එකී නියෝගය සමාලෝචන කිරීමක් හෝ දඬුවම් සමග සාධාරණීයකරනය කිරීමක් සිදු කර නොමැත.

ඒ අනුව 01 සහ 02 වන චෝදනාවන්ට වැරදිකරු කිරීම මත විනය පරීක්ෂණයේ දී A 5 සඳහන් සියලු චෝදනාවන්ට වැරදිකරු කර ඇත. එසේ වුවද 01 සහ 02 චෝදනාවන්ට වරදකරු නොවුනහොත් නිසැකවම ඉතිරි චෝදනාවන්ට ද වරදකරු කළ නොහැක.

02. **අභියාචනා විභාගය**

මේ අතරතුර ඉල්ලුම්කාර සේවක මහතා විනය විභාගයේ තීන්දුවට එරෙහිව අභියාචනා කළ අතර එකී අභියාචනයේදී R 12 නැතිනම් A 9 ලෙස ලකුණු කළ ලේඛනය ඉදිරිපත් වී ඇති බව දෙපාර්ශවයම පිළිගනී. එවැනි ලේඛනයක පැවැත්ම,

ඕමන්තගේ ගයාන් මහතාගේ සාක්ෂිය. (2022.04.27 සාක්ෂි සටහන් පිටුව 07)
මනම්පේරිගේ දොන් ජානක මහතාගේ සාක්ෂිය (2022.10.13 සාක්ෂි සටහන් පිටුව 9, 10)

මේ අනුව මෙම ලේඛනය විනය පරීක්ෂණයේදී දෙපාර්ශවයෙන්ම ඉදිරිපත් නොවුනු ලේඛනයක් වන අතර අභියාචනා විභාගයේදී මුල්වරට ඉදිරිපත් වූ ලේඛනයක් බවට හඳුනා ගත හැක. සාමාන්‍ය තත්ත්වයන් යටතේ නව ලේඛනයක් අභියාචනයේදී සළකා නොබැලෙන අතර තීන්දුව සමාලෝචනය කිරීමක් පමණක් සිදුවන නමුත් ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාව අනුව (R 12) අභියාචනයේදී **නැවත පරීක්ෂණයකට හෝ නැවත සුදුසු පරීක්ෂණයකට යොමු කිරීමට බලය ඇත.** ඒ පිළිබඳ දෙපාර්ශවයේම සාක්ෂිකරුවන් පිළිගෙන ඇත.

ඕමන්තගේ ගයාන් - *ඉල්ලුම්කරු වෙනුවෙන්,*

ප්‍ර : මම තමුන්ගෙන් ඇහුවේ අභියාචන විභාගයකදී ඉල්ලුම්කාර පාර්ශවය විසින් නැත්නම්, අභියාචක විසින් “R 12” කියන ලේඛනය ඉදිරිපත් කළා නම්, එය විනය ව්‍යවස්ථාවේ බලතල තිබෙනවා අභියාචන මණ්ඩලයට මේ පිළිබඳව නැවත පරීක්ෂණයකට යොමු කරලා ඒ ගැන නැවත සළකා බලන්න?

පි : ප්‍රතිපාදන තිබෙනවා

ප්‍ර : නමුත්, ඔය ලිපිගොනු අනුව එවැනි ක්‍රියාදාමයක් සිද්ධවෙලා නැහැ?

පි : නැහැ

(2022.04.27 සාක්ෂි සටහන් පිටුව 7)

මනම්පේරිගේ දොන් ජානක නිරෝෂන් - *වගඋත්තරකරු වෙනුවෙන්,*

ප්‍ර : දැන් තමුන් බලන්න විනය විභාගයකදී දෙන ලද නියෝගය සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කළ විට එම අභියාචන විභාගයේදී මේ විනය ලිපිගොනුවේ යම් දෝෂයක් තිබෙනවා නම්, ඊට අවධානය යොමුකරන්න පුළුවන් නේද, ඒ අයට?

පි : පුළුවන්

ප්‍ර : ඒ අයට බලයක් තිබෙනවා නේද, නැවත මේ සම්බන්ධ විනය පරීක්ෂණයක් යොමු කරන්නත්?

පි : තියෙනවා

ප්‍ර : ඒ වගේම අභියාචනා විභාගයේදී යම් ලේඛනයක් ඉදිරිපත් කරනවා නම්, ඒවාට සැළකිල්ල දක්වන්නත්, ඒ අයට බලය තියෙනවා?

පි : තියෙනවා

ප්‍ර : එහෙම කරලා නැත්නම්, එතන අයුක්තියක් වෙනවා?

පි : ඔව්

(2022.10.13 විභාග සටහන් 09, 10 පිටු)

**Ceylon Estate staft vs supted of mramore Estate:** නඩුවේදී,

The president of a labour tribunal should make a proper evaluation and consideration of the totality of the evidence before arriving at a conclusion.

වැදගත්ය. එසේම,

Lewis Brown 7 Co. LTD. Vs Percy Nelson
Christoper Periypperuma 81 CLW 30

That the order of the tribunal is not just and equtabel order if it is made without examination and consideration of all relevant evidence adduced at the inquiry හි දක්වා ඇති පරිදි ප්‍රදානය ලබා දීමේදී සියළු සාක්ෂි සළකා බැලීම අනිවාර්ය වේ.

මේ ආකාරයෙන් මෙම ප්‍රශ්නගත සිද්ධියට අදාළව ඉතා වැදගත් ලේඛනයක් ඉදිරිපත් වූ අවස්ථාවේ දී අවශ්‍ය ප්‍රතිපාදන තිබියදී එය නොසළකා හැරීම සාධාරණ හා යුක්ති සහගත නොවේ. මෙම R 12 ලේඛනය නිසි පරිදි එහිදී පරීක්ෂා කර ලැබුවේ නම් සමහර විට මෙම සියළු ප්‍රශ්න විසඳිය හැකිව තිබුණි.

ඒ අනුව සමස්ථයක් ලෙස සළකා බැලීමේදී මෙම ඉල්ලුම්කාර පළමු පාර්ශවය කලින් මෙවැනි ආකාරයේ චෝදනාවකට ලක්ව දඬුවම් ලබා තිබීම මත පමණක්ම හිඳිමින් විනය පරීක්ෂණ නිලධාරියාත්, ජ්‍යෙෂ්ඨ විනය නිලධාරියාත්, අභියාචනය විභාග කළ අභියාචන මණ්ඩල සභාපතිතුමාත් කටයුතු කර ඇති බව පෙනී යයි.

ඒ අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කරන බී. එම්. ප්‍රදීප් මංජුල මහතාට විරුද්ධව ප්‍රවේශ පත්‍ර විෂමාචාරයක් පදනම් කරගෙන 2014.09.29 වැනි දින පැවැත්වූ විනය පරීක්ෂණය හා ඊට අදාළව ලබා දුන් දඬුවම් යුක්තිසහගතද? යන යොමුවේ පළමු කොටස යුක්ති සහගත නොවන බවට නිගමනය කරමි.

දෙවන යොමුකිරීම සළකා බැලීමේදී,

මෙකී යොමුවේ දෙවෙනි යොමුකිරීම සළකා බැලීමේ දී කුමන සහනයක් ලබා දිය යුතුද යන්න සඳහා මෙම ඉල්ලුම්කාර සේවක මහතාට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය ඉවත් කිරීමට නියෝග කරමි. ඉල්ලුම්කාර පළමු පාර්ශවය වැඩ තහනමට ලක්ව සිටි මාස 4 ක කාලය ද විනය නියෝගය පරිදි වැඩ තහනම් කළ මාස 3 ක කාලය ද එකතුව මාස 7 ක කාලයක් සඳහා අහිමි කරන ලද වැටුප ඔහුට ගෙවිය යුතු බවට තීරණය කරමි.

එය, රු. 25,680.70 x 7 වශයෙන් රුපියල් 179,764.90 ක් (එක් ලක්ෂ හැත්තෑ නව දහස් හත්සිය හැට හතරයි ශත අනූවක්) හා නඩු ගාස්තු වශයෙන් රු. 100,000 ක (ලක්ෂයක) මුදලක් ද වගඋත්තරකාර දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් මෙම නියෝගය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත ඉල්ලුම්කාර පළමු පාර්ශවයට ලබාගත හැකි වන පරිදි නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස නියෝග කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

2023 ජූලි 20 වැනි දින දීය.

EOG 10 – 0109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.